# පැරණි ගොවියා වැස්සට හිසලූ බෝගාව

පැරණි ගම්බද ගොවීන් වැස්සට හිසලු බෝගාව නමැති උපකරණය කොත්මලේ හරංගල මහ විද්‍යාලයේ මා විදුහල්පතිව සිටියදී පැරණි ගොවි නිවසකදී දැක ඒ මැනවින් පරීක්‍ෂා කළෙමි. ඉන්පසු පේරාදෙණිය කෘෂි කෞතුකාගාරයේදී ඒ තිබෙනු දැන නැවත තොරතුරු දැන ගතිමි. ලංකාවට වැස්සට ඉසලන කුඩ භාවිතයට ආවේ ඉංග්‍රිසි යුගයේදීය. ඒ පිටිසර ගම්වලට පැතිරී ගියේ ඉතා සෙමිනි. එහෙත් පැරණි රජවරුන් ප්‍රධාන භික්ෂූන් ගමන් යාමේදී එද කුඩයකට වඩා විශාල ඡත්‍ර භාවිතා වී ඇත. ඉංග්‍රිසි යුගයේදී මෙරට වෙළඳ පොලට ආ පට කුඩ, පට රෙදි වලින් නිමවා විසිතුරු පෙට්ටි වල බහා පැමිණි අතර, උඩරට පැරණි නිවෙස්වල ඒ පටකුඩ හා පට කුඩ බහාලූ ඇසුරුම් පෙට්ටි කලාතුරකින් දැකිය හැක. පාරම්පරික ජීවන ක්‍රමය අනුව මෑතක් වනතුරු බොහෝ පිටිසර ගම්වල ඒවා දක්නට හැකි විය. ඔවුන් පාරම්පරික ක්‍රම අනුව වැස්සට භාවිතා කළේ තල අත්ත - තල අත්ත නවා සකස් කරගත් තල ගොටුව - කෙසෙල් අතු- පුවක් කොළ ගොටුව, ලොකු හබරල කොළ - තල අත්ත මෙන් ගොටුවක් හැඩයට නවාගත් ගෝනියයි. බෞද්ධ භික්ෂූන් මෙන්ම උඩරට ප්‍රභූන් තල අත්ත භාවිතා කල අතර, එය අත් දෙනෙක් අල්ලා ගෙන යායුතු විය.

තල අත්ත නවා බෙල්ලට ගැට ගැසිය හැකි ලෙස සකස් වූ තල ගොටුව කුඹුරේ, හේනේ වැඩට වැස්සේදී බහුලව භාවිතා විය. ද්‍රවිඩ කම්කරුවන් අතර, දළු නෙලීමේදී වැස්සට භාවිතා වූයේ ගොරෝසු රෙද්දකින් වියූ කම්බිලියයි. කම්බිලියට සියඹලා ගා පදම් කරගත් විට වැස්සට පසු ඒ ගසා දැමූ විට වතුර ඉවත විසිවෙයි. කම්බිලි අලෙවි කල කම්බිලි කඩ එද හැම නගරයකම විය. අව්වට පිරිමි තලප්පාවක් බැඳ ගත්හ. ගැහැණු අය ඔසරි පොට හෝ රෙදි කඩක් හිස දමා ගත්හ. ගම ඇතුළත කුඹුරේ හේනේ වැඩවලදී ගැහැණු පිරිමි දෙපිරිසම තල්ගොටුව හිස ලා නිකට ලඟින් තදකර ගත්හ. එවිට පහසුවෙන් කුඹුරේ වැඩ කල හැක. අධික වර්ෂාව ඇති විට ගම ඇතුලත කෙටි දුර ගමන් යෑමට ගොවිතැනට, කඩපිලට යෑමට පිටිසර ඇතැම් ගම්වල තල ගොටුව මෙන් බෝගාව භාවිතා විය. එහි බෝගාවේ හැඩය හා ප්‍රමාණය කුල්ලක් වැනිය. බෝගාව හදගත් අයුරු මෙසේය.

1. ගල්මත විශාලව වැවෙන බේදුරු කොල, වල් දෙල් කොළ, ගොඩපර කොළ, බටපොතු එකතු කර ගනී.

**එස්.කේ. ජයවර්ධන**
වත්තේගම හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ
සොමි කැළුම්, නාපාන, ගුන්නැපාන.

2. වල් දෙල් හා ගොඩපර කොළ උණු වතුරෙන් පදමට තම්බා ගනී. එහෙක් බේදුරු කොළ තැම්බිමක් නොකිරයි.

3. තැම්බු වල් දෙල් හා ගොඩබර කොළ නිද ගන්නා පැදුර හෝ ඇද යටට තබා දින කිහිපයක් නිද ගත් විට කොළ හොඳින් දිග හැරී වියළී පදම් වෙයි.

4. පදම් කරගත් කොළ කුල්ලක හැඩයට හා කුල්ලක ප්‍රමාණයට වියා ගැනීම ඊළඟ කාරියයි. පිටපැත්තට වියලුනු බේදුරු කොළ හා ඇතුල් පැත්තට වල් දෙල් හා ගොඩපර කොල හොඳින් අතුරා බට පොතු වලින් තද කර වියයි.

5. බෝගාවේ මුළු හා දර බට පොතු වලින් දෙතුන් වරක් ශක්තිමත්ව වියා ගනී.

6. වියාගත් බෝගාව දුමේ තබා දින කිහිපයක් දුම් ගසා පදම් කර ගනී

7. එය හිසේ පැලදීමට බෝගාව ඉහළින් කැළෑ වැල් කැබැල්ලක් ගැට ගසයි.

එය බෝගාව හිසේ පැළඳ නිකට යටට තබා වැල් කැබැල්ල ගැට ගසා ගැනීමටයි.

මෙසේ සකස් කරගත් බෝගාව කුඹුරේ, හේනේ වත්තේ වැඩට වර්ෂාවේ ගමන් බිමන් යෑමට පිරිමි ගැහැණු භේදයකින් තොරව භාවිතා විය. වියළා හොඳින් වියා දුම් ගසා පදම් කරගත් බෝගාවක් අවුරුදු පණහක් පමණ පාවිච්චි කල හැක.

## තේරවිල්ලක්

ටං ටං ගාන්නා තෝරා එවාප — න්
ටිං ටිං ගාන්නා තෝරා එවාප — න්
මග වැලි පිසින්නා තොරා එවාප — න්
දෙගම්ඩ රජා තෝරා එවාප — න්

ටං ටං ගාන්නා ගෝනා නොවේ — දේ
ටිං ටිං ගාන්නා ලේනා නොවේ — දේ
මග වැලි පිසින්නා ලේනා නොවේ — දේ
දෙගම්බඩ රජා කිඹුලා නොවේ — දේ